# අඛණ්ඩ පැවැත්ම

ජීවන්ත පෙරේරා

ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# අඛණ්ඩ පැවැත්ම / Going Concern – (SLAuS 570)

- ❖ හැඳින්වීම
- ❖ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කළමනාකාරීත්වයේ වගකීම හා විගණකගේ වගකීම
- ❖ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ඇඟවීම
    - a) මූල්‍ය ඇඟවීම (Financial Indicators)
    - b) ක්‍රියාකාරී ඇඟවීම (Operating Indicators)
    - c) වෙනත් ඇඟවීම (Other Indicators)
- ❖ ඇඟවීමක දුටු පමණින්ම අවසන් නිගමනයකය එළඹිය හැකිද?
- ❖ ක්‍රියාපටිපාටීන්
- ❖ වාර්තාකරණය

## හැඳින්වීම

අඛණ්ඩ පැවැත්ම සංකල්පයට අනුව ව්‍යාපාර ඒකකයක් නුදුරු අනාගතය දක්වා එහි ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමට හැකි බව උපකල්පනය කරයි. ව්‍යාපාරයක් තම මූල්‍ය වාර්තා පිළිවෙල කරනු බලන්නේ අඛණ්ඩ පැවැත්ම මත පදනම්වය.

## අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කළමනාකාරීත්වයේ හා විගණකවරයාගේ වගකීම

අඛණ්ඩ පැවැත්ම සංකල්පයේ යෝග්‍යතාවය පිළිබදව වගකීම ව්‍යාපාර ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය/ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ වගකීමක් වේ.

මෙහිදි ව්‍යාපාරයේ කළමනාකාරීත්වය සතු එම වගකීම ප්‍රශ්නාර්ථයකට ලක්වන අවස්ථා වලදී, ඒ පිළිබඳව සලකා බැලීමේ වගකීම විගණක සතු වේ. විගණන ක්‍රියාපටිපාටින් සැලසුම් කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදි ප්‍රතිඵල ඇගයීමේදී හා සමාලෝචනය කිරීමේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඒ හා අදාළ වන හෙළිදරව් කිරීම් සඳහා පාදක වි ඇති අඛණ්ඩ පැවැත්ම උපකල්පනයේ යෝග්‍යතාව ප්‍රශ්නාර්ථයකට තුඩුදෙන අවස්ථාවන් පිළිබඳව විගණක සලකා බැලිය යුතු වේ.

මෙහිදී විගණක,

1. ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් (Material Uncertainty) තිබේද (ගැටලුකාරී තැන් තිබේද) යන්න පිළිබඳව සලකා බැලැය යුතු වේ.
2. මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා අදාළවූ අඛණ්ඩ පැවැත්ම සංකල්පයේ යෝග්‍යතාවය සඳහා ප්‍රමාණවත් හා යෝග්‍ය සාක්ෂි රැස් කර ගැනිම සිදු කළ යුතු වේ.
3. එය විගණනය කරනු ලබන මූල්‍ය වාර්තා / විගණන මතය කෙරෙහි ඇති කරන බලපෑම සලකා බැලිය යුතු වේ.

මෙමනිසා විගණක විගණනය සැලසුම් කිරීමේදී, ක්‍රියාත්මක කිරීමේදී හා සමාලෝචනයේදී (සමස්ථ විගණන ක්‍රියාවලිය පුරාවට) අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් නිරන්තර ප්‍රශ්නාර්ථයන් මතු කරන,

a) මූල්‍යමය ඇඟවීම් (Financial Indicators)

b) ක්‍රියාකාරී ඇඟවීම් (Operating Indicators)

c) වෙනත් ඇඟවීම් (Other Indicators)

පිළිබඳව සලකා බැලිය යුතු වේ.

"JMC vLearning "your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

a) මූල්‍යමය ඇඟවීම් සඳහා උදාහරණ

1. ව්‍යාපාරය දිගින් දිගටම වසර ගණනාවක් මෙහෙයුම් අලාභ ලැබීම්
2. ශුද්ධ වගකීම් තත්වය / ශුද්ධ ජංගම වගකීම් තත්වය
3. ලාභාංශ ගෙවීම් නවතා දැමීම / හිඟහිටි ලාභාංශ පැවතීම
4. ණය හිමිටන්ට නියමිත කාලයට මුදල් නොගෙවීම හා ණය ගිවිසුම්වල කොන්දේසි පැහැර හැරීම
5. මේ දක්වා ණයට භාණ්ඩ සැපයූ සැපයුම්කරුවන් ණය පදනමේ සිට මුදල් පදනමට මාරුවීම
6. නැවත ප්‍රතිසම්පාදනය කිරීමේ අදහසක් රහිතව ව්‍යාපාරයේ ස්ථාවර වත්කම් විකිණීම
7. අහිතකර මූලික මූල්‍ය අනුපාතයන්

b) ක්‍රියාකාරී ඇඟවීම් වලට උදාහරණ

1. ප්‍රධාන වෙළඳපල අහිමි වීම
2. ප්‍රධාන සැපයුම්කරුවන් අහිමි වී යෑම
3. ශ්‍රමය සපයා ගැනීමේ දුෂ්කරතා මතුවීම
4. නැවත පිරවීමක් රහිතව ඉහළ කළමනාකාරිත්වය ඉවත් වීයෑම
5. ආයතනයකට මුහුණදිය නොහැකි ආකාරයට නිෂ්පාදන තාක්ෂණයේ වෙනස්කම් සිදුවීම

c) වෙනත් ඇඟවීම් වලට උදාහරණ

1. රාජ්‍ය ප්‍රතිපත්තිවල නීතිරීති වල සිදුවන වෙනස්කම්
2. ආනයන/අපනයන කොන්දේසි

## ඇඟවීමක් දුටු පමණින්ම අඛණ්ඩ පැවැත්ම පිළිබඳව අවසන් නිගමනයට එළඹිය හැකිද?

සමස්ථ විගණන ක්‍රියාවලිය පුරාවට ඇඟවීමක් දුටු පමණින්ම අඛණ්ඩ පැවැත්මක් නැතැයි යන අවසන් නිගමනය කරා විගණකට එළඹිය නොහැක. මක් නිසාද යත් එවැනි ඇඟවීම්වල වැදගත්කම කළමනාකරණය අනුගමනය කරන යම් යම් ක්‍රියාමාර්ගයන් හරහා ඉවත් කලහැකි බැවිනි.

උදාහරණ:

1. ව්‍යාපාරය දිගින් දිගටම මෙහෙයුම් අලාභ ලැබීම් අඛණ්ඩව පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රශ්නාර්ථයක් මතු කරන මූල්‍යමය ඇඟවීමක් වුවද, ඉදිරි අනාගතය සඳහා කළමනාකාරිත්වය පිළියෙල කරන්නා වූ නිසි ආකාර සැලැස්මක් මගින්, පසුගිය වසර වල අලාභ ලැබීමෙන් ඇති වන අහිතකර බලපෑම ඉවත් වී යයි.
2. ප්‍රධාන වෙළඳපොළ අහිමි වි යෑම, ප්‍රධාන සැපයුම්කරුවන්ව අහිමි වී යෑම අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රශ්නාර්ථයකක් මතු කරන ක්‍රියාකාරී පැවැත්ම සම්බන්ධයෙන් ප්‍රශ්නාර්ථයක් මත කරන ක්‍රියාකාරී ඇඟවීමක් වුවද නව වෙළඳපොලවල් සොයා ගැනීම හා නව සැපයුම්කරුවන් සොයාගැනීම මගින්, ප්‍රධාන වෙළඳපොළ අහිමි වී යෑම හා ප්‍රධාන සැපයුම්කරුවන් අහිමි වී යෑම මත ඇති වන අහිත කර බලපෑම ඉවත්වී යයි.

මේ අනුව අඛණ්ඩ පැවැත්ම උපකල්පනය යෝග්‍යතාවය සම්බන්ධයෙන් විගණකට ගැටලුවක් මතු වූ විට, (ඇඟවීම් දුටු විට) නුදුරු අනාගතය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ආයතනයට ඇති හැකියාව සම්බන්ධයෙන් සෑහීමකට පත්විය හැකි ආකාරයට ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ප්‍රමාණයක් පහත සඳහන් ක්‍රියාපටිපාටින් මගින් රැස් කරගත යුතුවේ. මේ සඳහා පහත සඳහන් ක්‍රියාපටිපාටි විගණක අනුගමනය කල යුතු වේ.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

1. අඛණ්ඩව පැවැත්ම සම්බන්ධයෙන් මතු වී ඇති ගැටලුවලට කළමනාකාරිත්වය ගෙන ඇති වැඩ පිළිවෙල පිළිබදව ඔවුන් සමග සාකච්ඡා කිරීම.
2. නඩු කටයුතු හා වන්දි ඉල්ලීම් සම්බන්ධයෙන් ගැටලු ඇති නම් ඒ පිළිබදව නීතිඥයන්ගෙන් විමසීම.
3. කොටස් හිමියන්ගේ, අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීම් වාර්තා පරීක්ෂා කර බලා එහිදි අඛණ්ඩ පැවැත්ම සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කර ඇත් දැයි සලකා බැලීම.
4. කළමනාකාරිත්වය අඛණ්ඩව ව්‍යාපාර කටයුතු කරගෙන යෑමට ඇති හැකියාව සම්බන්ධයෙන් තක්සේරුවක් කර ඇද්ද යන්න සලකා බැලීම හා එවැනි තක්සේරුවක් කර නොමැතිනම්, එය සිදු කරන ලෙස දැන්වීම.

## වාර්තාකරණය

ඉහත සඳහන් ක්‍රියාපටිපාටියන් සිදු කර ප්‍රමාණවත් හා යෝග්‍ය සාක්ෂි ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සලකා බලා අඛණ්ඩ පැවැත්ම පිළිබඳව අවසන් නිගමනයට විගණක එළඹිය යුතුවේ.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd